"නිරෝගිකම පරම සැපතයි"


අධ්‍යක්ෂ
பணிப்பாளர்
Director
} 081 – 2224336

කාර්යාලය
அலுவலகம்
Office
} 081 – 2222341/ 081-2220206-8

ෆැක්ස්
பக்ஸ்
Fax
} 081 – 2204755


මගේ අංකය
எமது இல
My NO.
} CPC/PDHS/A-6 /4/2023

ඔබේ අංකය
உமது இல
Your No.
} ........................................

දිනය
Date
} 2023.12. 19


**සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව – මධ්‍යම පළාත.**

சுகாதார திணைக்களம் - மத்திய மாகாணம்

Department of Health Services – Central Province.

163, සංඝරාජ මාවත, මහනුවර.

163, Sangaraja Mawatha, Kandy.

163, சங்கராஜ மாவத்தை, கண்டி.


**ඉතා වැදගත්**

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
මහනුවර/ මාතලේ/නුවරඑළිය
වෛද්‍ය අධිකාරි /දිස්ත්‍රික් මූලික රෝහල
තෙල්දෙණිය/දඹුල්ල/රිකිල්ලගස්කඩ/දික්ඔය
නියෝජ්‍ය අධ්‍යක්ෂ(පුහුණු) ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය යටිනුවර,
ආයතනභාර වෛද්‍ය නිලධාරි,පුනරුත්ථාපන රෝහල,දිගන
ජීව වෛද්‍ය ඉංජිනේරු/ ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය වටපුළුව,

**<u>වාර්ෂික ස්ථාන මාරු වීම්- 2024</u>**

2023 වර්ෂයේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා මාගේ සමාංක හා 2023-10-05 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, දැනට ක්‍රියාත්මක වන මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති මෙම දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු පරිපාටියෙහි සඳහන් විධිවිධාන අනුව 2024 වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමට තීරණය කරන ලදී. මේ සමඟ අදාළ පුරප්පාඩු ලේඛන 2023-12- 23 දින මෙම දෙපාර්තමේන්තුවේ www.healthdept.cp.gov.lk වෙබ් අඩවියට යොමු කරන අතර, ඒ සම්බන්ධයෙන් අදාළ සියලුම කාර්යය මණ්ඩලය දැනුවත් කර 2024 වර්ෂයේ ස්ථාන මාරු කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස දන්වමි.

03. 2023 වර්ෂයට අදාළව මේ දක්වා ක්‍රියාත්මක නොවී ඇති ස්ථාන මාරු නියෝග මෙම අයදුම්පත් කැඳවීමත් සමඟ අවලංගු නොවේ. එම ස්ථාන මාරු නියෝග ලද නිලධාරින්/සේවක මහත්ම මහත්මීන්ට එම සේවා ස්ථානය හැර වෙනත් සේවා ස්ථානයක් අපේක්ෂා කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා ද නැවත අයදුම්පත් ඉදිරිපත් කලහැකිය. එමෙන්ම මේ වන විට වාර්ෂික ස්ථාන මාරු වලට යටත්ව තාවකාලික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන්ද මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

04. ස්ථාන මාරුවීම් සඳහා හිමිකම් ලබන අයගේ ලැයිස්තු සකස් කිරීමේදි අදාළ සේවා ස්ථාන (වර්තමාන සේවා ස්ථානයේ කාලය අනුව ජ්‍යෙෂ්ඨත්වය සැළකිල්ලට ගෙන ඒ අනුව අනුපිළිවෙලට ලැයිස්තුවක් සකස් කිරීමට කටයුතු කළ යුතුවේ.) හා සුදුසුකම් ලබන සියලුම නිලධාරින්ගේ / සේවකයින්ගේ විස්තර හා නම් ඇතුළත් කර ඇති බවට අදාළ සියළුම නිලධාරින් පෞද්ගලිකවම වගකිව යුතු වේ. එම ලැයිස්තුවේ නම් සඳහන්ව නොමැති වුවද ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලැබූ සියලුම නිලධාරින් හා සේවකයින් නියමිත උපදෙස් පරිදි ස්ථාන මාරු වීම් අයදුම්පත් ඉදිරිපත් කිරීම **2024-01-20** වන දිනට පෙර සිදු කළ යුතුය.එසේ කටයුතු නොකළ අවස්ථා පිළිබඳව මෙම කාර්යාලයේ දත්ත බැංකුවේ සඳහන් විස්තර අනුව හෝ දැන්වීම් මත පසුව කරුණු අනාවරණය වුවහොත් පුරප්පාඩු පවතින සේවා ස්ථානයකට ඔවුන් අනුයුක්ත කරනු ලැබේ.

05. මෙම කාර්යාලය යටතේ සෘජුවම පාලනය වන යටිනුවර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ,දිගන පුනරුත්ථාපන රෝහල හා වටපුළුව ජිව වෛද්‍ය ඒකකය කාර්ය මණ්ඩල වලට අදාළ ස්ථාන මාරු අයදුම්පත් ස්ථාන මාරු විම් මණ්ඩලයට ඉදිරිපත් කිරිමට හැකි වන අයුරින් සකස් කර මහනුවර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත **2024-01-10** දිනට පෙර එවිමට කටයුතු කල යුතුයි. පෞද්ගලික ලිපිගොනු තම ආයතනයේ පවත්වාගෙන යන රෝහල් වල ස්ථාන මාරු අයදුම්පත් ද ස්ථාන මාරු මණ්ඩලයට ඉදිරිපත් කිරිමට හැකි වන අයුරින් සකස් කර අදාළ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධක්ෂ මගින් එවිමට කටයුතු කළ යුතුයි.

06 ස්ථාන මාරු විමට අපේක්ෂා කරන සේවා ස්ථාන නම් කිරිමේදි අවම වශයෙන් සේවා ස්ථාන 10ක් වත් නම් කිරිම (තම මනාපය අනුව) අනිවාර්යය බවත්, තමන් දැනට සේවය කරන සේවා ස්ථානය ස්ථාන මාරු විමට අපේක්ෂිත සේවා ස්ථානය ලෙස සඳහන් නොකරන ලෙසත්, එය සැළකිල්ලට නොගෙන තම සේවා ස්ථානය සඳහන් කර ඇති අවස්ථා වලදි සේවා අවශ්‍යතාවය හා පුරප්පාඩු සැළකිල්ලට ගෙන ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි ස්ථාන මාරු කරනු ලැබේ. එමෙන්ම අසත්‍ය තොරතුරු ලබා දි ඇති අයවලුන් සඳහාද ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු පවතින ස්ථාන වලට ස්ථාන මාරු කිරිමට කටයුතු කරනු ලැබේ.

7. පහසු සේවා ස්ථාන වල නිලධාරින්ගේ ඉල්ලිම් සලකා බලනු ලබන්නේ දුෂ්කර සේවා ස්ථාන වල සේවය කරන නිලධාරින්ගේ ඉල්ලිම් සලකා බැලිමෙන් පසුවය. එමෙන්ම ලබා දි ඇති ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරිමේ දි වැඩි සේවක සංඛ්‍යාවක් ඇති ආයතනයේ රාජකාරි ආවරණය කිරිමට අභ්‍යන්තර වශයෙන් තාවකාලික වැඩ පිළිවෙලක් යොදා අනුප්‍රාප්තිකයෙකු පැමිණෙන තෙක් නොසිට ප්‍රථමයෙන් නිලධාරින් /සේවක මහත්ම මහත්මින් මුදා හැරිමට කටයුතු කල යුතුයි.

08.තවද මේ සම්බන්ධව නොපමාව ඔබ කොට්ඨාශයේ අදාළ සියලුම කාර්යය මණ්ඩල දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ඔබ වෙත එවා ඇති ස්ථාන මාරු වීම් පරිපාටියේ සඳහන් උපදෙස් විධිවිධාන පරිදි 2024 වර්ෂයේ ස්ථාන මාරුවීම් අයදුම්පත් කැඳවා අනිවාර්යෙන්ම 2024 -01-20 දිනට ප්‍රථමව මා වෙත යොමු කිරීමට ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

වෛද්‍ය එම්. එන්.වීරසූරිය.
මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

වෛද්‍ය එම්. එන්. වීරසූරිය
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
මධ්‍යම පළාත.

පිටපත්:-

01.මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා - කාරුණික දැන ගැනීම සඳහා
02.ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව -කාරුණික දැන ගැනීම සඳහා
03.ලේකම්,මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කාරුණික දැන ගැනීම සඳහා
04.ලේකම්,මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යංශය - කාරුණික දැන ගැනීම සඳහා
05 විශේෂඥ, වෛද්‍ය නිලධාරි/(සැලසුම්) - කාරුණික දැන ගැනීම සඳහා
06. විෂය භාර නිළධාරින් A2/A7/A9/A11/A14/A17/A19 - අවශ්‍ය කටයුතු සඳහා